**තඹලගමුව ප්‍රාදේශීය සභාව - 2023**

**--------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

තඹලගමුව ප්‍රාදේශීය සභාවේ 2023 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට තඹලගමුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගැයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලැසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිති,රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේ දී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොලිය වන රු. 4,573,444 ක් රු. 4,393,444 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති බැවින් වර්ෂය සඳහා වූ වියදම රු. 180,000 කින් අඩුවෙන් දක්වා තිබුණි. | දැනට නිවැරදි කර නිවැරදි මුදල අදාල ලේඛනවල ඇතුළත් කර ඇත. | දේශීය ණය සංවර්ධන අරමුදලට ගෙවිය යුතු පොළිය මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කළ යුතුය. |

### 1.6.2 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතු වටිනාකම රු. 5,958,896 ක වූ ගිණුම් වෂයන් 03 කට අදාල සාක්ෂි විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2024 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට කටයුතු කරනු ලැබේ. | ලියවිලි ලබා ගැනීම සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුය |

## 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 (1), (2), (3) | වර්ෂ දෙකකට වැඩි කල් ඉකුත් තැන්පතු 16 ක් සම්බන්ධයෙන් සභාව අදාළ පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුමට මාරු කිරීමට කටයුතු කර නොතිබුණි. | අදාල තැන්පතු ආපසු ලබා දීමට හෝ සභාඅවේ ආදායමට මාරු කිරීමට නිසි කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව සුදුසු කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | 2021 අගෝස්තු 16 දිනැති නැගෙනහිර පළාත් මූල්‍ය චක්‍රලේඛ අංක PT/03/2021 | ඇප මුදල් අයකළ යුතු නිලධාරීන් 08 දෙනෙකුගෙන් ඇප මුදල අය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඇප මුදල් ලැබීම සම්බන්ධයෙන් මේ වන විට සුදුසු ක්‍රියාමාර්ග ගන්නා බව | මූල්‍ය චක්‍රලේඛය අනුව අදාල ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචන

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 6,998,328 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 2,317,203 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිලිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2023 | | | | 2022 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල්කල ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 300,000 | - | - | - | - | - | - | - |
| (ii) | කුලී | 9,623,000 | 6,203,000 | 5,994,000 | 209,000 | 13,150,000 | 5,804,000 | 5,450,000 | 4,028,000 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,274,000 | 1,273,000 | 1,273,000 | - | 1,200,000 | 855,000 | 710,000 | 145,000 |
| (iv) | වෙනත් ආදායම් | 715,000 | - | 623,000 | - | 1,722,000 | 995,000 | 995,000 | - |
| | එකතුව | 11,912,000 | 7,476,000 | 7,890,000 | 209,000 | 16,072,000 | 7,654,000 | 7,155,000 | 4,173,000 |

#### 2.2.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ සියලුම ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය සම්බන්ධ නිරීක්ෂණයන් පහත දැක්වේ.

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| **(අ)** | **කුලී** | | |
| (i) | සතිපොළ කුලීකරුවන්ගෙන් අයවිය යුතු රු. 121,200 ක කුලී මුදල වසර 03 කට වැඩි කාලයක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ආදායම් පරීක්ෂකවරයාගේ වාර්තාව අනුව සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟ කුලී අය කිරීමට සුදුසු පියවර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 වන දින දක්වා ටෙන්ඩර් මත බදු දීමෙන් ලැබිය යුතු මුදල රු. 6,881,628 කි. එයින් රුපියල් 201,549 ක මුදල වසර 05 කට වැඩි කාලයක් හිඟව තිබුණි. | 2021 වර්ෂයේ දී හිඟකරුවන්ට නීතිඥ මගින් Letter of Demand යවා ඇත. ඉදිරියේදී අනිකුත් අයට නිසි නීතිමය ක්‍රියාමාර්ග ගනු ලැබේ. | හිඟ සම්බන්ධයෙන් නිසි පියවර ගත යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2012 වසරේ කාර්යාල ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය ණය සංවර්ධන අරමුදලින් ලැබුණු රු. 18,291,467 ක ණය මුදල සහ රු. 4,573,444 ක ගෙවිය යුතු පොලී මුදල එම අරමුදලට පියවීමට විගණිත දිනය දක්වා සභාව කටයුතු කර නොතිබුණි. | සභාවේ ආදායම ඉතා අඩු බැවින් එම ණය පියවීම සිදු නොවන අතර එම ණය මුදල ගෙවීමට නිසි පියවර ගනු ලැබේ. | ණය සහ පොලිය ගෙවීමට නිසි පියවර ගත යුතුයි |
| (ආ) | කාබනික පොහොර නිෂ්පාදනය වැඩිදියුණු කිරීමේ අරමුණින් 2021 වර්ෂයේ දී මිලදී ගත් රු. 1,500,000 ක් වටිනා යන්ත්‍රය සහ එය ස්ථාපිත කිරීම සඳහා රු. 803,520 ක වියදමින් සාදන ලද ස්ථානය යනාදියට යටිතල පහසුකම් වැඩ නිම නොවූ බැවින් කාබනික පොහොර නිෂ්පාදන ක්‍රියාවලිය වසර 03 කට වඩා වැඩියෙන් නිෂ්කාර්යව පැවතුණි. | කාබනික පොහොර නිෂ්පාදනය සඳහා යටිතල පහසුකම් වැඩ නිම නොකිරීම නිසා එම යන්ත්‍ර භාවිතා කළ නොහැකි තත්ත්වයේ පවතී. | වත්කම් ප්‍රයෝජනයට ගැනීමට සුදුසු ක්‍රියාමාර්ග ගත යුතුයි |
| (ඇ) | 2017 වසරේ රු. 1,749,125 ක වියදමින් සම්පූර්ණ කරන ලද ඊච්චනකර් ළමා උද්‍යානයේ රැඳවුම් මුදල කොන්ත්‍රාත්කරුට ගෙවීම සඳහා සභා විසින් කටයුතු නොකර වසර 03 කට වැඩි කාලයක් තැන්පතු ගිණුමේ රඳවාගෙන තිබුණි. | රැඳවුම් මුදල ආපසු ගෙවීම හෝ සභාවට ආදායමක් ලෙස පරිවර්තනය කිරීම සම්බන්ධයෙන් සුදුසු උපදෙස් ලැබීමෙන් පසු ඊට අදාල ක්‍රියාමාර්ග ගනු ලැබේ. | රැඳවුම් මුදල ආපසු ගෙවීමට පියවර ගත යුතුයි. |

### 3.2 වත්කම් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **නඩත්තු සහ අලුත්වැඩියා නොකිරීම** | | |
| (i) | සභාව සතු වාහන 06 ක් අලුත්වැඩියා කර නැවත භාවිත කිරීමට හෝ වෙන්දේසියේ විකිණීමට වසර 03 කට වැඩි කාලයක් සභාව විසින් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඔවුන් විසින් සඳහන් කරන ලද වාහන 06 ක් සඳහා 2024 දී තක්සේරු කර නැවත භාවිත කිරීමට හෝ වෙන්දේසි කිරීමට පියවර ගනු ලැබේ. | වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක: 05/2020 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය අනුව පියවර ගත යුතුයි. |
| (ii) | සභා බල ප්‍රදේශයට අයත් ඊච්චනගර් ළමා උද්‍යානයේ ඇති ක්‍රීඩා උපකරණ වර්ග 05 ක් සහ උද්‍යානයේ ප්‍රධාන දොරටුව කැඩී ගොස් ඇති බව දක්නට ලැබුණද එය පිළිසකර කිරීමට කටයුතු කර නොතිබුණි. | 2024 වර්ෂය සඳහා අයවැයෙන් යෝජිත ආදායම ලද විගස ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා කර ළමයින්ගේ භාවිතය සඳහා ලබා දෙනු ලැබේ. | ළමා උද්‍යානයේ ක්‍රීඩා උපකරණ අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. . |
| (ආ) | **පවරා නොගත් වත්කම්** | | |
| | සභාව විසින් භාවිතා කරන වාහන 06 ක අයිතිය සභාවේ නමට පැවරීමට විගණනය දිනය දක්වා සභාව විසින් කටයුතු කර නොතිබුණි. | එම වාහනවල අයිතිය පවරා ගැනීමට කටයුතු කර ඇති අතර ඉදිරියේදී අයිතිය පවරා ගැනීමට නියමිතය. | වාහන සභාවේ නමට අයිතිය පවරා ගත යුතුයි. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2013/2014 කාලය තුළ භාවිතා කරන ලදුපත් පොත් 09 ක් සහ ටිකට්පත් මගින් අය කරන ලද මුදල් ප්‍රමාණය සභාවට භාර නොදීම හේතුවෙන් සභාවේ නිලධාරියෙකුට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන සිදුවූ හානිය එම නිලධාරියා ගෙන් අයකිරීමට වසර 10 ට වැඩි කාලයක් සභාව විසින් කටයුතු කර නොතිබුණි. | ලදුපත් පොත භාවිත කළ නිලධාරියාට එරෙහිව මූලික පරීක්ෂණයක් සිදු කර ඇත. | විනය ක්‍රියා මාර්ග නියමිත කාලය තුළ ගත යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 තිරසාර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත අනුව තිරසාර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන භෞතිකව ළඟා කර ගැනීමට හැකි වන පරිදි සැලැස්මක් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී මේවා ගැන වැඩි අවධානයක් යොමු කිරීමට පියවර ගනු ලැබේ. | තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම සඳහා සැලැස්මක් සකස් කිරීමට පියවර ගත යුතුය |